**ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 02 දින ගණන්දීමේ නිලධාරීයා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපි වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිවාඩු නිකේතන සහ ගොවිපොළවල් ඇතුළු ආදායම් උපදවන ව්‍යාපෘති මගින් සමාලෝචිත වර්ෂය තුල උපයාගත් ආදායම් ගිණුම්ගතකර නොතිබුණි. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මානව හා භෞතික සම්පත් යොදාගනිමින් වාණිජමය පදනමක් සහිතව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘති වල මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කල යුතුය. | මේවා මගින් ලබන ආදායම් සුභසාධන කටයුතු සඳහා යොදා ගනු ලබන බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොමැත. |

### 1.6.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ පිටපතක් ලබා දෙන බව දන්වා ඇත. |

යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.6.3 අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 136,137 හා 138 අනුව කටයුතු කිරීමකින් තොරව, ගුවන් හමුදා සුභසාධක අරමුදලට වවුචර් 5 ක් මගින් රු.මිලියන 2.93 ක් ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි 138 (3) අනුව වියදම් සහතික කරන නිලධාරියා විසින් වියදම සහතික කිරීමට පෙර අධීක්ෂණය කිරීම සිදු කල යුතු වේ. තවද භාණ්ඩාගාරය විසින් වාර්ෂික ප්‍රතිපාදන මගින් ගුවන් හමුදාවට වෙන්කරන මුදලින් මෙසේ සුභාසාධන අරමුදල් සඳහා ගෙවීම් කිරීමට අනුමැතියක් ලබාදීම සුදුසු නොවේ. | ශ්‍රී ලංකා ගුවන් හමුදා විධායක සුභසාධක අරමුදල මගින් ගුවන් හමුදාවේ හදිසි වියදම් අවශ්‍යතා සපුරා ගැනීමට මෙසේ කලද රජයේ නියමිත ටෙන්ඩර් පටිපාටියට අනුකූලව ප්‍රතිපූර්ණය කරනු ලැබේ. නියමිත පරිදි ටෙන්ඩර් ලිපිගොනු සකසා අදාල බිල්පත් සමග අනුමැතිය සඳහා ඉදිරිපත් කර මුදල් අධ්‍යක්ෂක මගින් මුදල් ප්‍රතිපූර්ණය කරනු ලබන බව දන්වා ඇත. |
| (ආ) | 2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ශ්‍රී ලංකා ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි සහ 2016 ජූනි 24 දින පැවැත්වූ රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාර ලාභ උපයන ව්‍යාපෘතිවල මෙහෙයුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු | මෙම අරමුදල් ගුවන් හමුදා නියෝග අංක 852 අනුව පිහිටුවා ඇති අතර එම අරමුදල් ගුවන් හමුදා විධායක විගණන අංශය විසින් විගණනය කරනු ලබන බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| සඳහා සහ අරමුදල් මගින් මෙහෙයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බවද තවදුරටත් නිරීක්ෂණය විය. | අධීක්ෂණ කටයුතු විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ. | |

## 2. **මූල්‍ය සමාලෝචනය**

**---------------------**

### 2.1 **ආදායම් කළමනාකරණය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>---------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------- |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2019 වර්ෂය සඳහා ගුවන් යානා කුලී ආදායම රු.මිලියන 220 ක් ලෙස ඇස්තමේන්තු කර පසුව එය රු.මිලියන 100 ක් ලෙස සංශෝධනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 128 ක ආදායමක් රැස්කර තිබුණි. රැස්කල ආදායම සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 128 ක් වී තිබුණි. | රාජ්‍ය ආදායම සම්බන්ධ මූල්‍ය කළමණාකරණය ශක්තිමත් කිරීම සඳහා ආයතනය විසින් උපයා ගැනීමට බලාපොරොත්තු වන ආදායම වඩාත් නිවැරදිව තක්සේරු කිරීමට කටයුතු කල යුතුවේ. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු වානිජ ගුවන් මෙහෙයුම් කටයුතු සිදු කල හැකි ගුවන් යානා ප්‍රමාණය සහ ඒවායේ යෝග්‍යතාවය පහත වැටීම මත වානිජ ගුවන් මෙහෙයුම් සීමා කිරීමට සිදුවී ඇත. |

| | | |
|---|---|---|
| (ආ) විගණනයට ඉදිරිපත් කළ අංක 20.03.02.16 දරන ගුවන් යානා කුලී ආදායම් ගිණුම අනුව එකතුව රු. මිලියන 13.17 ආදායම් හිඟහිට තිබුණි. එම හිඟ හිටි ආදායම අතුරින් රු.මිලියන 10.82 ක් වර්ෂ 4 සිට වර්ෂ 15 ක් අතර කාල පරාසයකට අදාළ විය. | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව කඩිනමින් ආදායම් රැස්කර ගැනීමට ආදායම් එකතු කරන නිළධාරීයා කටයුතු කල යුතුය. | අයකරගත හැකි ශේෂ සඳහා සිහි කැඳවීම් යැවීමටද අයකර ගත නොහැකි බවට නිර්දේශ කර ඇති ශේෂ කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට භාණ්ඩාගාරය වෙත යොමුකර ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>-------------------- | නිර්දේශය<br>------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------- |
|---|---|---|
| (අ) නිසි අධ්‍යානයකින් සහ අවශ්‍යතා හරිහැටි හඳුනා ගැනීමෙන් අනතුරුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, මුදල් රෙගුලාසි 66 මගින් වැය විෂයයන් අතර රු.මිලියන 1034.8 ක ප්‍රතිපාදන මාරු කර තිබූ අතර පරිපූරක ඇස්තමේන්තු මගින් තවත් රු.මිලියන 728.1 ක අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම සිදු කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | ගුවන් හමුදා සංයුක්ත සැලැස්ම, ගුවන් හමුදා දැක්ම,මහා භාණ්ඩාගාරය සහ ආරක්ෂක අමාත්‍යාංශය මගින් නිකුත් කල නියෝග සහ උපදෙස් අනුව ඇස්තමේන්තු සකස් කරන ලදී.ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන මුළු ප්‍රමාණයම නොලැබීම නිසා වැය විෂයන්ගේ කාර්යභාරයට බලපෑමක් නොවන පරිදි ප්‍රතිපාදන මාරු කර ගන්නා ලදී. |
| (ආ) වැය විෂයයන් 51 ක් සඳහා එකතුව රු.මිලියන 5,513 ක අධි ප්‍රතිපාදන සලසා තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක පැවතුනි. ඉහත වැය විෂයයන් තුල ඇතුලත් විෂයයන් 7 කට අදාල රු.මිලියන 2,544 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කල යුතුය. | බිල්පත් ප්‍රමාද වීම, ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම, මිලදී ගැනීම් එම වර්ෂය තුළදී සිදුනොවීම, විදේශ රටවල තාක්ෂණ උපදේශ මත කරනු ලබන ගුවන් යානා අලුත්වැඩියා සමාලෝචිත වර්ෂය තුල නිම නොවීම යන කරුණු මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට බලපා ඇති බව දන්වා ඇත. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වැය විෂයයන් 2 ක් සදහා රු.මිලියන 49.6 කින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹී තිබූ අතර ඇස්තමේන්තු කිරීමකින් තොරව තවත් වැය විෂයයන් 2 ක් සදහා රු.මිලියන 3.2 කින් බැරකම්වලට එළඹී තිබුණි | මුදල් රෙගුලාසි 94 අනුව කටයුතු කල යුතු වීම. | වැය විෂයයන් දෙකක ප්‍රතිපාදන ඉක්මවා බැදීම් වලට එළඹ තිබුනද සමස්ත ගුවන් හමුදා ඇස්තමේන්තුවේ අදාල වැය විෂයන්ගේ ප්‍රතිපාදන සලකන විට බැදීම් මගින් බැරකම් ඉක්මවීම සිදු වී නොමැති නිසා සේවා අවශ්‍යතාවය මත සිදු කරන ලද බව දන්වා ඇත. |

.

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත වූ කාර්යයන් සම්බන්ධයෙන් වෙනත් අමාත්‍යාංශ 05 ක් හා දෙපාර්තමේන්තු 03 ක් මගින් එකතුව රු.මිලියන 832 ක මුදලක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත මාරුකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 620 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන ඉතිරිය සියයට 25.5 ක් විය. | ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු සොයා බලා නිශ්චිත කාර්යයන්ට උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

## 2.5 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර 2019 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව | ණය ගෙවීම පැහැර හැර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **XLVII** | අයකර ගත හැකි ශේෂ සදහා සිහිකැදවීම් යැවීමටද අයකර ගත නොහැකි බවට නිර්දේශ කර ඇති ශේෂ කපා හැරීමට භාණ්ඩාගාරය වෙත යොමු |

| | | |
|---|---|---|
| රු.මිලියන 13.71 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 5 ට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. | පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | කර ඇති බව දන්වා ඇත. |

3 **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් මෙන්ම අරමුදල් උපයෝගී කර ගනිමින් පෞද්ගලික සමාගමක් වශයෙන් පවත්වාගෙන යනු ලබන හෙලිටුවර්ස් සමාගම 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වසර 10 ක කාලයක් තුල රු.මිලියන 57.4 ක ලාභයක් උපයාගෙන තිබුණි. එහෙත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකල ආයෝජනයට කිසිදු ප්‍රතිලාභයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි | හමුදාව වෙත ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබා ගැනීමට කටයුතු කල යුතු වීම. | සමාගමේ අයිතිය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර ඇති අතර එහි තීරණය අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව දන්වා ඇත. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයට අදාල ක්රියාකාරි සැලැස්මේ මුළු ප්‍රගතිය සියයට 99 ක් වූවද, ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය සියයට 66 ක් විය. අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 91 ක් පමණක් බවත් නිරීක්ෂණය විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය සමාලෝචනය කර සතුටුදායක ප්‍රගතියක් අත්කර ගත යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

## 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මෝටර් රථ සහ වෑන් රථ සේදීම සඳහා 2018 සැප්තැම්බර් 20 දින රු.මිලියන 65.41 ක් වටිනා සේදුම් යන්ත්‍ර දෙකක් මිලදී ගෙන තිබුණි. මෙම යන්ත්‍ර දෙක වාහන 2534 ක් සේදීමෙන් පසු 2019 ඔක්තෝබර් 01 විගණන දින වන විට මාස 8 කට ආසන්න කාලයක් අක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. මෙම යන්ත්‍ර මිලදී ගැනීමේදී පිරිවිතරවල තිබුණු Pre Washing Plant උපාංග වෙනුවට වෙනත් උපාංගයක් සපයා තිබුණු අතර ඒ වෙනුවෙන් ලංසු වටිනාකමින් රු. 356,000 ක් අඩුකර ගෙවීම් කර තිබුණි. එමෙන්ම වාහන 6000 ක් සේදීමට අවශ්‍ය සේදුම්කාරක ලබාදීමට එකග වී ඇතත් සපයා තිබූ සේදුම්කාරක වාහන 2534 ක් පමණක් සේදීමට ප්‍රමාණවත් විය. | සැපයුම්කරු එකගවූ පරිදි වාහන 6000 ක් සේදීමට අවශ්‍ය සේදුම්කාරක ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම සහ අවශ්‍ය සේදුම් කාරක දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | වාහන 6000 ක් සේදීමට අවශ්‍ය සේදුම්කාරක ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර වගකීම් කාලය අවසන් වීමෙන් පසු දේශීය සැපයුම්කරුවන්ගෙන් සේදුම්කාරක මිලදී ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කටුනායක සහ හිගුරක්ගොඩ මූලික කඳවුරු තුළ 2019 නොවැම්බර් 20 දින වන විට රු.මිලියන 25.76 ක් වටිනා Material drill khaki - (8325001050) රෙදි, මීටර් 61,327 ක් වසර දෙකකට වඩා වැඩි කාලයක් ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය. අ | අවශ්‍යතාවය හඳුනාගනිමින් මිලදී ගැනීම මගින් තොග පාලන ක්‍රියාවලිය ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගැනීම අවශ්‍ය වේ. | මෙම තොගයෙන් කලිසම් හා කබායන් මැසීමට අනුමැතිය ලැබී ඇති අතර ඉතිරි තොගය 2021 වර්ෂයේ භාවිතයට ගැනීමෙන් අවසන් වන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගුවන් හමුදාවේ භෝජනාගාර සංග්‍රහ සේවකයින් සඳහා ලබාදෙන එකක් රු.1,475 ක් බැගින් වූ රු.මිලියන 1.36 ක් වටිනා සුදු අත් දිග කමිස (84905002030) 922 ක් සහ සුදු ටී ෂර්ට් රෙදි මීටර් 12,139 ක්ද 2019 නොවැම්බර් 03 දිනට ඌන උපයෝජිතව ගබඩා කර තිබුණි. ඉන් රු.66,300 වටිනා සුදු ටී ෂර්ට් රෙදි මීටර 195 ක් අවපැහැ ගැන්වීම නිසා භාවිතයෙන් ඉවත් කර තිබුණි. | වාර්ෂික පරිභෝජනය නිශ්චිතව හදුනාගෙන මිලදී ගැනීමට වගබලා ගත යුතුය. | ඉදිරි වර්ෂ සඳහා නිකුත් කිරීමට බලාපොරොත්තු වන බව දන්වා ඇත. |
| (ඇ) | (i) කටුනායක මූලික කඳවුරේ ගුවන් යානා අමතර කොටස් අංශයේ 2004 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අළුත්වැඩියා කටයුතු සඳහා විදෙස් රටවලට යවා තිබුණු ගුවන් යානා අමතර කොටස් අයිතම 38 ක් හා 2016 වර්ෂයේදී යවන ලද අයිතම 7 ක් ගුවන් හමුදාව වෙත ආපසු ලැබී නොතිබුණි. | විදේශයන්ට යවන ලද අමතර කොටස් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. | විදේශයන්ට යැවූ අයිතම 5 ක් ගෙන්වා ගෙන ඇති අතර අනෙක් අයිතම් ගෙන්වා ගැනීමට ක්‍රියාමර්ග ගෙන ඇති බව දන්වා ඇත. |
| | (ii) එම ගබඩාවේ නිකුත් නොවන සහ සෙමින් චලනය වන තොග විෂයයන් 442 කට අදාළ අයිතම 27541 ක් ඊ - කාණ්ඩය තුළ ගබඩා කර තිබුණි. | මෙම තොග පිළිබද අනෙකුත් කඳවුරු වලට දැනුවත් කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතු වීම. | ගබඩාවේ තොග චලනය නොවන ගබඩාවට මාරු කර ඇති බවත් විෂයයන් 225 නිකුත් කරමින් සිටින බව දන්වා ඇත. |
| (ඈ) | කටුනායක මූලික කඳවුරේ වාහන අළුත්වැඩියා අංගනය තුල 2019 නොවැම්බර් 05 දිනට ඩිෆෙන්ඩර් රථ 31 පැවති අතර ඉන් වාහන 16 ක් වසර 2 ත් වසර 08 ත් අතර කාලයක සිට පැවතිණි. තවද අනෙකුත් වාහන 145 ක් පැවති අතර ඉන් වාහන 25 ක් වසර 04 කට වඩා වැඩි කාලයක සිට පැවති අතර භාවිතයට ගත නොහැකි වාහන 84 ක් අපහරණය සඳහා නිර්දේශ කර වසරකට වැඩි කාලයක් ගතවූවද අපහරණය කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. | දිරා පත් වීමට පෙර වාහන කඩිනමින් අළුත්වැඩියා කිරීම් කල යුතු අතර අලුත්වැඩියා කළ නොහැකි වාහන කඩිනමින් අපහරණ කළ යුතුය. | අවශ්‍ය අමතර කොටස් ගෙන්වා අළුත්වැඩියා කිරීමට පියවර ගන්නා අතර භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

**3.5** **පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| ---------------------- | ------------ | --------------------------- |
| (අ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 අනුව පිළියෙල කර තිබුණු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට අනුව වර්ෂ 05 කට අඩු සිද්ධීන් 205 කට අදාළ රු.මිලියන 815.62 මුදලක්ද වර්ෂ 5ත් 10 ත් අතර සිද්ධීන් 19 කට අදාළව රු.මිලියන122.03 ක මුදලක්ද වර්ෂ 10 කට වැඩි සිද්ධින් 28 කට අදාළ රු.මිලියන 17.53 ක්ද වශයෙන් මුළු සිද්ධින් 252 කට අදාළව රු.මිලියන 955.18 ක්වූ මුදලක් අයකර ගැනීමට, කපා හැරීමට හෝ අත්හැරිමට තිබෙන පාඩු ලෙස වාර්තා කර තිබුණි. | අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. | අයකර ගැනීමට, කපාහැරීමට, අත්හැරීමට කටයුතු කරමින් පවතින බවට අදහස් දක්වා ඇත. |
| (ආ) ගුවන් 5078 දරණ ට්‍රක් රථයේ එන්ජිම අළුත් වැඩියා කිරිම සඳහා 2009 නොවැම්බර් 20 දින මිල ගණන් කැඳවා ආයතනයකට රු.මිලියන 0.16 ක් වටිනා, ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. එම එන්ජිම 2010 ජූනි 21 දින අලුත්වැඩියා කටයුතු සඳහා අදාළ ආයතනයට භාර දී තිබුණද වටිනාකම රු.මිලියන 1.34 ක්වූ එන්ජිම අලුත්වැඩියා කර කඳවුර වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිටස්තර ආයතන වෙත අලුත්වැඩියාව සඳහා ලබාදෙන අමතර කොටස් හැකි විගස අලුත්වැඩියා කර ලබා ගැනීමට කටයුතු කල යුතුය. සිදුවී ඇති මෙම අලාභය වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් පියවර ගත යුතු වීම. | අදාළ නිලධාරීන්ගෙන් සහ සේවකයින්ගෙන් අලාභය අයකර ගැනීමට නිර්දේශ කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) චීනවරාය විද්‍යා පීඨයේ ගුවන් යානා නවතා තැබීම සඳහා ඉදිකරමින් පැවති කොන්ක්‍රීට් ආවරණය ඉදිකිරීම් අතරතුරේදී 2009 අගෝස්තු 24 දින කඩා වැටීමට ලක්ව තිබූ අතර මෙම ඉදිකිරීම් කටයුතු සිදුකල සමාගමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව යකඩ සහ අත්තිකාරම් මුදල්ද ලබා දී තිබුණි. මේ | සිදුවී ඇති අලාභය අයකර ගැනීමට වගකිව යුතු පාර්ශවයන් කටයුතු කල යුතුය. | පරීක්ෂණ අධිකරණ වාර්තා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.මෙම සමාගම අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සිදුවූ අලාභය රු. මිලියන 30.95 කි. මෙම අලාභය මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | | |
| (ඇ) රේඩාර් රිසිවරය සහ ඇන්ටනා ස්කෑනරය 2015 වර්ෂයේ ගුවන් මගින් විදේශීය අළුත්වැඩියාව සඳහා යැවීමේදී අස්ථානගතවීම නිසා රු.මිලියන 98.69 ක අලාභයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සිදුවී තිබුණි. මේ සඳහා රක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා අලාභයේ වටිනාකමින් රු.493,438 ක මුදල ඒ සඳහා වගකිව යුතු නිළධාරියකුගේ වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර තිබූ අතර 2019 සැප්තැම්බර් 30 දින වන විට ඉන් රු.112,888 ක මුදලක් පමනක් අයකර ගෙන තිබුණි. | මෙම අලාභය අදාල සමාගමෙන් අයකර ගැනීමටත් පසුව සමාගම අසාදු ලේඛනගත කිරීමටත් පියවර ගත යුතුය. එමෙන්ම අලුත්වැඩියාවන් සඳහා භාණ්ඩ විදේශගත කිරීමට පෙර රක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ වන විට අදාල නිලධාරියාගේ වැටුපෙන් අයකර ගෙන ඇති අතර 2023 වන විට සම්පූර්ණයෙන් අයකර ගනු ලබන බව දන්වා ඇත. |
| (ඉ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2009 වර්ෂයේදී සූර්ය බල විථී පහන් 187 ක් සැපයුම්කරුවන් දෙදෙනෙකු වෙතින් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 19.94 වටිනා වීථි පහන් 148 ක ප්‍රමාණයක් පාවිච්චි කල නොහැකි වී තිබුණි. මෙම අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලික සමාගම් දෙකෙන් මෙම මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම අලාභය අයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කල යුතු වීම. | මෙම සමාගම් අකර්මන්‍ය වී ඇති බැවින් එම සමාගම් වල මව් සමාගමෙන් මෙම අලාභය අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව හරහා කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. |

**5 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| --------------------- | ------------ | ------------------------ |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 40505 ක් වූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට පුරප්පාඩු 3455 ක් පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 50 ක් තෘතීයික මට්ටමේ පුරප්පාඩු 441 ද්විතීක මට්ටමේ පුරප්පාඩු 2070 හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 830 ක් ඒ අතර විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 28,170 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.397,640 ක් වී තිබුණි. | ගුවන් හමුදා සේවා නිලධාරීන් සහ සෙසු නිලයන් සඳහා බඳවා ගැනීමට කටයුතු කල යුතු වීම. | අදහස් දක්වා නොමැත. |